සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

1033

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම**
**ஆண்டிறுதி மதிப்பீடு - 2018**
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | කාලය / காலம் / Time: පැය 02යි. |

නම : ........................................................................ විභාග අංකය : ..........................................

**සැලකිය යුතුයි :**
- වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

## I කොටස

(01) දෙවියන් වහන්සේගේ ස්ථිර ප්‍රේමය තුළින් අපට උරුම වී ඇති සමාජ ඒකකය වන්නේ,

(1) යහළුවන් ය. (2) පාසල ය.
(3) පවුල ය. (4) පල්ලි ය.

(02) දේව මැවිල්ලේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සම්බන්ධ නිවැරදි වැකිය.

(1) වර්තමානයේ පමණක් පවතින අනාගතයට ගමන් නොකරන ක්‍රියාවලියකි.
(2) අතීතයේ කෙටි කාලයක් පමණක් පවතින ක්‍රියාවලියකි.
(3) අනාගත ලොව පැවැත්ම බිඳ දමන ක්‍රියාවලියකි.
(4) අතීත, වර්තමාන, අනාගතයට සදාකාලිකව ඉදිරියට යන ක්‍රියාවලියකි.

(03) "මුහුදේ ...... කෙරෙහි ද, අහසේ ........... කෙරෙහි ද, පොළොවේ සැරිසරන සියලු ........... කෙරෙහි ද බලය පවත්වන්න."

(1) බෙල්ලන්, සතුන්, සිවු පාවුන් (2) මසුන්, පක්ෂීන්, සතුන්
(3) මාළුන්, කපුටන්, දරුවන් (4) මත්සයින්, ගේ කුරුල්ලන්, දූ දරුවන්

(04) ස්නානය කළ තැනැත්තේ මුළුමනින් ම පවිත්‍ර ය. එහෙත් හැම කෙනෙක් ම එසේ නොවෙති. හැම කෙනෙක් ම පවිත්‍ර නො වෙති. මෙය පවසන ලද්දේ කවුරුන් විසින් කා හට ද?

(1) ජේසුන් වහන්සේ විසින් සීමොන් පේදුරුට ය.
(2) ස්නාවක ජොහාන් විසින් ජනතාවට ය.
(3) ජේසුස් වහන්සේ විසින් ගෝලයන්ට ය.
(4) ස්නාවක ජොහාන් විසින් බවතීස්මයට පැමිණි සෙනඟට ය.

(05) ජේසුන් වහන්සේ නැවත නැගිටීමෙන් පසු කොපමණ දින ගණනක් විවිධ ස්ථානවල දර්ශනය වුවා ද?

(1) දින 10 ක් ය. (2) දින 30 ක් ය.
(3) දින 50 ක් ය. (4) දින 40 ක් ය.

(06) රන් අණ තුළින් පෝෂණය වන අප,

(1) එයින් දිවියට අරුතක් ලබමින් පිළිපදින්නට යහපත් වටාපිටාවක් ගොඩ නැගිය යුතු ය.

(2) එය ව්‍යවස්ථාවලියේ හා දිවසාවලියේ හරය සේ පිළිගත යුතු ය.

(3) එය සවන් දීමෙන් තම කැමැත්ත ඉටු කළ යුතු ය.

(4) එයට සවන් දීමෙන් අන් මතයට කැප වී කටයුතු කළ යුතු ය.

(07) වචනය අසා එය පිළිපදින කිතුණු ජීවිත සමාන වන්නේ,

(1) වැලි මත ගෙය තනා ගත් මනුෂ්‍යයාට ය.

(2) එක් රන් කාසියක් ලැබූ මනුෂ්‍යයාට ය.

(3) පර්වතය මත ගෙය තනා ගත් මනුෂ්‍යයා ය.

(4) රන් කාසි 20ක් ලැබූ මනුෂ්‍යයාට ය.

(08) ලොව පුරා සාගතයක් පැවති කළ සහා මූලිකයින් වෙත ආධාර යැවීමට භාර දුන්නේ,

(1) ක්ලෞදියස් රජුට හා හොරොද් රජුට ය.

(2) සයිරස් රජුට හා බාර්ණබස්ට ය.

(3) සාවුල්ට හා බාර්ණබස්ට ය.

(4) මතෙව්ට හා සාවුල්ට ය.

(09) බයිබලයේ පොදු නව අනුවාදය නිකුත් කළ වර්ෂය වන්නේ,

(1) 2012 වසරේ දී ය. (2) 1982 වසරේ දී ය.

(3) 2004 වසරේ දී ය. (4) 2006 වසරේ දී ය.

(10) "ක්‍රිස්තුස් වහන්සේ යයි කියන මෙසියස් තුමාණන් එන බව දනිමි." මෙය කා විසින් පවසන ලද්දක් ද?

(1) සීමොන් පේදුරු ය. (2) සමාරිය ස්ත්‍රී ය.

(3) මරියතුමී ය. (4) ස්නාවක ජොහාන් ය.

(11) තම හැකියා දේව ගෞරවය උදෙසා කැප කළ යුතු බව ප්‍රකාශ කෙරෙන උපමාව වන්නේ,

(1) නැති වූ පුත්‍රයාගේ උපමාව (2) වපුරන්නාගේ උපමාව

(3) රන්කාසි දසය පිළිබඳ උපමාව (4) අවිශ්වාස දාසියන් පිළිබඳ උපමාව

(12) "ඔබේ ඇඟිල්ල මෙහි බහා මගේ අත් බලන්න." ජේසුන් වහන්සේ මෙම වදන් පැවසුවේ කුමන හේතුව නිසා ද?

(1) ප්‍රේරිතයන් තුළ තිබූ අවිශ්වාසවන්තකම නිසා ය.

(2) ක්ලේයෝපස් තුළ තිබූ විශ්වාසවන්තකම නිසා ය.

(3) තෝමස් තුළ තිබූ අවිශ්වාසවන්තකම නිසා ය.

(4) සීමොන් පේදුරු තුළ තිබූ දේව ගෞරවනීය කම නිසා ය.

(13) ඔබේ සතුරන්ට .................... කරන්න. ඔබට ................ කරන්නන් උදෙසා යාච්ඤා කරන්න. මෙහි හිස් තැනට සුදුසු වචන් කාණ්ඩය වන්නේ,

(1) ප්‍රේම, වෛර (2) යහපත, සතුරුකම්

(3) සේවය, වෛර (4) ප්‍රේම, පීඩා

(14) සුදර්ශන දොරටුව අසල සිටි කොර වූ මනුෂ්‍යයා සුවය ලැබූ පසු කළ ක්‍රියාව,

(1) පේදුරුට හා ජොහාන්ට සැලකීමට ක්‍රියා කිරීම.

(2) දේව මාලිගාවට තුටු පඬුරු පූජාවක් කිරීම.

(3) ඇවිදිමින් පවුලට ලැබූ ආශිර්වාද ගැන ස්තුති කිරීම.

(4) ඇවිදිමින්, උඩ පනිමින් දෙවිඳුන්ට ප්‍රසංසා කිරීම.

(15) පෙන්තකොස්ත දින "ගිනි දළු වැනි දිව්" සියලු ශ්‍රවකයින් මත පිහිටු වනු ලැබූ බව පැවසීමෙන් අදහස් වන්නේ,

(1) ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩ සිටින හා සාක්ෂි දැරීමේ බලයයි.

(2) ශුද්ධාත්මයාණන්ව සියුම් බසින් කතා කිරීමේ බලයයි.

(3) ශුද්ධාත්මයාණන් වහන්සේ මරණින් ගලවන බලයයි.

(4) ශුද්ධාත්මයාණන් ජීවිතයේ බිය පහ කරන බලයයි.

(16) දෙවි පියාණන් මිනිසා නිර්මාණය කොට ජීවන හුස්ම ලබා දීමෙන්,

(1) මිනිසාට බලයක් ලබා දුන්නේ ය.

(2) මිනිසාට රැකවරණය ලබා දුන්නේ ය.

(3) මිනිසාට පෝෂණය ලබා දුන්නේ ය.

(4) මිනිසාට ජීවය ලබා දුන්නේ ය.

(17) ග්‍රීක් භාෂාවෙන් 'බිබ්ලියා' යන්නෙහි තේරුම වන්නේ,

(1) පොත් (2) පුවරු

(3) ශුද්ධ (4) ලියවිලි

(18) ජේසුස් වහන්සේ "ස්වර්ග රාජ්‍ය මෙබඳුවන් ගේ ය." යැයි පැවසීමෙන් අදහස් කළේ,

(1) දෙවියන් වහන්සේගේ රාජ්‍යයට දරුවන් බාධාවක් බව ය.

(2) දෙවියන් වහන්සේගේ රාජ්‍ය කුඩා දරුවන් ට පමණක් බවය.

(3) දෙවියන් වහන්සේගේ රාජ්‍ය කුඩා දරුවකු සේ පිළිගත යුතු බව ය.

(4) දෙවියන් වහන්සේගේ රාජ්‍ය උසස් බව පිළිගත යුතු බව ය.

(19) ශුද්ධ බයිබලයේ පැරණි ගිවිසුමේ ලතින් අනුවාදය හඳුන්වන නාමය,

(1) සෙප්තුවා ජින්ත (2) පොදු නව අනුවාදය

(3) ලතින් අනුවාදය (4) වල්ගේට්

(20) බහු ආගමික, බහු ජාතික ජන කොටස් වලින් සැදුම් ලත් ලාංකික සමාජයේ කිතුණු අප කටයුතු කළ යුත්තේ,

(1) සෑම ආගමික ශාස්තෘවරුන් කියූ දේ අදහමින් ක්‍රියා කිරීම.

(2) කිතුණු දහම පමණක් අදහමින් අන් මත හෙලා දකීමෙන් ක්‍රියා කිරීම.

(3) විවිධ සංස්කෘතීන් ට ගරු කරමින් සහජීවනයෙන් ක්‍රියා කිරීම.

(4) සෑම දර්ශනයක ට ම පණිවිඩකට නමස්කාරයෙන් යුතුව ක්‍රියා කිරීම.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තව ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න. පළමු ප්‍රශ්නය අනිවාර්ය ය.

(01) (i) ජේසුස් වහන්සේ පැවසූ පරිදි පවුලක් ලෙස ජීවත් වීමේ දී තිබිය යුතු උසස් ම ගුණාංගය කුමක් ද?
(ii) මතෙව් 6 : 33 පරිදි 'පළමු කොට කුමක් සොයන්න.' යැයි ජේසුස් වහන්සේ පැවසූවේ ද?
(iii) උදෑසන → දහවල → සවස → රාත්‍රිය; මෙමඟින් පෙන්වන්නේ දේව මැවිල්ලේ කුමන ක්‍රියාකාරීත්වයක් ද?
(iv) "පසු තැවී සිත් හරවා ගන්න මන්ද ස්වර්ග රාජ්‍ය ළඟය." මෙසේ පැවසූවේ කවු ද?
(v) "ලුණු රසය වෙනස් කරයි." මින් කිතුණු අපගේ ජීවිතයට ලැබෙන ආදර්ශය දක්වන්න.
(vi) කොර වූ පුද්ගලයා බලාපොරොත්තු වූ ජීවිතයට අවශ්‍ය ම දේ දෙන්නට පේදුරු සමත් විය. ඒ කුමක් ද?
(vii) පෙන්තකොස්ත දින දේශනයේ දී පේදුරු තුමා සඳහන් කළේ පුරාණ ගිවිසුමේ කවර දිවැසිවරයාගේ කොටසක් ද?
(viii) ජේසුස් වහන්සේ කුරුසියේ දී පැවසූ පළමු වදන කුමක් ද?
(ix) "ඔබ ............. පෙර, ඔබේ .................. කවරේ දැයි පියාණන් වහන්සේ දන්නා සේක." (ශු මතෙව් 6:5) හිස්තැනට සුදුසු ම වචන දක්වන්න.
(x) මේරි ජෝන්ස් ට බයිබලයේ ලබා දුන්නේ කවරෙක් ද? (ලකුණු 2 x 10 = 20)

(02) (i) ස්නාවක ජොහාන් ගේ පවුල් පසුබිම පිළිබඳ වාක්‍ය 02 ක් දක්වන්න. (ලකුණු 2)
(ii) ස්නාවක ජොහාන්ගේ දේශනයෙන් පරිසිවරුන් ට සද්දාසිවරුන්ට කළ චෝදනා මොනවා ද? (ලකුණු 3)
(iii) දේවගරු බිය ඇති ජීවිතයක් ගත කිරීමට ඔබ කළ යුතු දේවල් 3 ක් විස්තර කරන්න. (ලකුණු 5)

(03) (i) "පියාණෙනි, ඔබ කැමති සේක් නම් මේ කුසලාන මාගෙන් පහ කළ මැනව." ජේසුස් වහන්සේ මෙසේ පැවසූවේ කොහේ දී ද? (ලකුණු 2)
(ii) "කුමක් කමු ද? කුමක් අඳිමු ද? කියා කරදර නොවන ලෙස" කීමෙන් ජේසුස් වහන්සේ අපට පෙන්වන අදහස් දෙකක් දක්වන්න. (ලකුණු 3)
(iii) එදිනෙදා ජීවිතයේ අප අතින් සිදු වන වැරදි ගැන පසු තැවිලි වෙමින් කරන යාච්ඤාවක් ලියන්න. (ලකුණු 5)

(04) (i) තෝමස් නම් ගෝලයා ජේසුස් වහන්සේ උත්ථාන වූ ජේසුස් වහන්සේ හඳුනා ගත් සාක්ෂි 02 ක් දක්වන්න. (ලකුණු 2)
(ii) පෙන්තකොස්ත දින ශුද්ධාත්ම දානය ලැබීමෙන් පසු ගෝලයන් ක්‍රියා කළ ආකාර 03 ක් දක්වන්න. (ලකුණු 3)
(iii) ඔබ අයත් සභාවේ වැඩ කටයුතුවලදී ඔබට කළ හැකි සේවාවන් 03 ක් විස්තර කරන්න. (ලකුණු 5)

(05) (i) ආදි යුගයේ ශුද්ධ ලියවිලි ලියා තැබීමට භාවිත කළ දේවල් 02 ක් දක්වන්න. (ලකුණු 2)
(ii) මේරි ජොන්ස් පිළිබඳ වාක්‍ය 03 ක් ලියන්න. (ලකුණු 3)
(iii) අප අවට අසල්වාසීන් එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන විවිධ ප්‍රශ්නවලට කරදරවලට අපට කිතුණුවන් ලෙස කළ හැකි උපකාර 03 ක් විස්තර කරන්න. (ලකුණු 5)

(06) (i) "නැති වූ බැටළුවාගේ උපමාවේ" "එඬේරා" "බැටළුවන්" යන්න කවු දැයි නම් කරන්න. (ලකුණු 2)
(ii) "අත්කිවාරම් දෙක පිළිබඳ උපමාව" කෙටියෙන් දක්වන්න. (ලකුණු 3)
(iii) කිතුණු දරුවෙකු වන ඔබ හොඳ පන්ති නායකයෙකු සේ ක්‍රියා කරන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 5)

(07) * පහත දැක්වෙන මාතෘකා 02 ක් තෝරා කෙටි සටහන් ලියන්න.
(i) ශු බයිබලය කිතුණු අපට වටිනාම ග්‍රන්ථයයි.
(ii) දේව මැවිලි සුරැකීම අපගේ වගකීමයි.
(iii) ජේසුස් වහන්සේ හා දරුවන්
(iv) රන් කාසි දසය පිළිබඳ උපමා හා උගත හැකි පාඩම්
(v) සුදර්ශන දොරටුව අසල සිටි කොර වූ මිනිසා මම ය. (ලකුණු 5 x 2 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Answer

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තු ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I ,II | පිළිතුරු පත්‍රය |

## I කොටස

(01) - 3
(02) - 4
(03) - 2
(04) - 1
(05) - 4
(06) - 1
(07) - 3
(08) - 3
(09) - 4
(10) - 2
(11) - 3
(12) - 3
(13) - 4
(14) - 4
(15) - 1
(16) - 4
(17) - 1
(18) - 3
(19) - 4
(20) - 3

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) දේව ප්‍රේමය, ස්ථිර ප්‍රේමය (12 පිටුව, 4 පාඩම)
(ii) ස්වර්ග රාජ්‍ය, දේව රාජ්‍ය (1 පාඩම, 2 පිටුව)
(iii) අඛණ්ඩ ක්‍රියාකාරීත්වය, චක්‍රාකාර බව (3 පාඩම, 9 පිටුව)
(iv) ස්නාවක ජොහාන්නුමා ය. (5 පාඩම, 16 පිටුව)
(v) අන් අයගේ ජීවිත වෙනස් කිරීමට, අප අපගේ ජීවිත දෙව්දූන්ගේ යහපත් ලක්ෂණවලින් (7 පාඩම, 26 පිටුව)
(vi) සුවයයි (13 පාඩම, 49 පිටුව)
(vii) ජොවෙල් දිවැසිවරයාගේ (11 පාඩම, 42 පිටුව)
(viii) "පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව ඔවුන් කරන දේ ඔවුහු නොදනිති." (9 පාඩම, 35 පිටුව)
(ix) ඉල්ලන්වත්, වුවමනා (14 පාඩම, 53 පිටුව)
(x) තෝමස් වාල්ස් මහතා (74 පිටුව 19 පාඩම) (ලකුණු 2 x 10 = 20)

(02) (i) 5 පාඩම 15 පිටුව (ලකුණු 2)
(ii) 5 පාඩම 17 පිටුව (ලකුණු 3)
(iii) 4 පාඩම 13 පිටුව (ලකුණු 5)

(03) (i) 6 පාඩම 22 පිටුව (ලකුණු 2)
(ii) 1 පාඩම 2 පිටුව (ලකුණු 3)
(iii) අදාළ පිළිතුරට ලකුණු දෙන්න. (ලකුණු 5)

(04) (i) 10 පාඩම 39 පිටුව (ලකුණු 2)
(ii) 12 පාඩම 44 පිටුව (ලකුණු 3)
(iii) අදාළ පිළිතුරට ලකුණු දෙන්න. (ලකුණු 5)

(05) (i) 18 පාඩම 70 පිටුව (ලකුණු 2)
(ii) 19 පාඩම 73 පිටුව (ලකුණු 3)
(iii) 17 පාඩම 65 පිටුව (ලකුණු 5)

(06) (i) 15 පාඩම 56 පිටුව (ලකුණු 2)
(ii) 14 පාඩම 55 පිටුව (ලකුණු 3)
(iii) අදාළ පිළිතුරට ලකුණු දෙන්න. (ලකුණු 5)

(07) (i) 18 පාඩම 68, 69 පිටු
(ii) 02 පාඩම 05 පිටුව
(iii) 16 පාඩම 60, 61 පිටු
(iv) 15 පාඩම 57 පිටුව
(v) 13 පාඩම 48,49 පිටු (ලකුණු 5 x 2 = 10)